නව නිර්දේශය

අධ්‍යාපන අමාත්‍යංශය

NEW | 44 S I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2018 දෙසැම්බර් (ආදර්ශ පෙරහුරු ප්‍රශ්න පත්‍ර)

**නැටුම් (දේශීය)** | **පැය තුනයි**

## නැටුම් (දේශීය)

**විශේෂ උපදෙස්**
**සියළුම අයදුම් කරුවන් I කොටසේ ප්‍රශ්න 30 ට ම පිළිතුරු සැපයිය යුතුය. එයට අමතරව II උඩරට නර්තනය, III පහතරට නර්තනය හෝ IV සබරගමු නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.**
**II , III හා IV කොටස් වලින් කලවමේ ප්‍රශ්න තෝරා නොගත යුතුය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතුය.**

සැලකිය යුතුයි
සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරාගන්න.
ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01 උඩරට පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් මූලික සරඹ අභ්‍යාස වන්නේ

01. පාසරඹ හා ඉලංගම් සරඹ
02. පාසරඹ හා දොමින පද
03. පාසරඹ හා මන්ඩි පද
04. ඉලංගම් සරඹ හා දොමින පද

02. "රටකට මවු සමගින් නැව්නැග යන කළ අප මුනිඳුන්" මෙම කවි පද කොටස..............................ගායනය අයත් වේ

01. මල් යහන් කවි
02. සවරං කවි
03. රබන් කවි
04. චාමර කවි

03. මහනුවර යුගයේ ප්‍රශස්ති කාව්‍ය ගායනය කරන ලද්දේ

01 ශාන්ති කර්ම මඩුවේදී ය
02. දළදා මළුවේදී ය
03 මඟුල් මඩුවේදී ය
04. කවිකාර මඩුවේදී ය

04. උඩරට , පහතරට හා සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනෙහිම ප්‍රධාන ශාන්තිකර්ම වල දක්නට ලැබෙන නර්තන අංගයක් වන්නේ.

01. හත් පදය
02. යක්තුංපදය
03. පත්තිනි පද
04. කොලොන්න පද

05. දළදා කරඬුව මාලිගාව තුලට වැඩමවීමේ දී ....................................................වාදනය කරයි.

01. අඹරා හේවිසි 02. ගෙවැදුම් හේවිසි

03. හැන්දෑ ධූරය 03. අළුයම් ධූරය

06. ජුගුප්සා නැමති ස්ථායි භාවය තුළින් උපදින රසය වනුයේ

01. බීභත්ස රසය යි 02. ශෘංගාර රසය යි

03. අත්භූත රසය යි 04. භයානක රසය යි

07. වේදිකා නාට්‍යක චරිත ස්වභාවය තීව්‍ර කිරීමට වඩාත් උචිත වන්නේ.

01. මෙවලම් භාවිතය 02. අංගරචනය

03. පසුබිම් වාදනය 04. පසුතල නිර්මාණය

08. පණ්ඩුකාභය රජු ඉදිරියේ දෙව්මිනිස් නැටුම් පැවැත්වූ බව ..................................... සඳහන් වේ.

01. මහා වංශයේ 02. චූල වංශයේ

03. දීප වංශයේ 04. බෝධි වංශයේ

09. කොහොඹා කංකාරිය හා සමාජය , හෙළ ගී මග යන කෘතීන් රචනා කර ඇත්තේ

01. ජේ.ඊ. සේදරමන් මහතා හා ඩබ්.ඩී. මකුලොළුව මහතා ය.

02. ඥාණසිරි පීරිස් මහතා හා ජේ.ඊ. සේදරමන් මහතා ය.

03. මුදියන්සේ දිසානායක මහතා හා ඩබ්.ඩී. මකුලොළුව මහතා ය.

04. ආනන්ද ජයසිංහ මහතා හා තේජා ගුනවර්ධන මහතා ය.

10. "හනික වරෙව් කොල්ලනේ ගීතය" ඇතුලත් වනුයේ

01. දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑනා නාට්‍යයේ ය.

02. බන්දුල ජයවර්ධනයන්ගේ බෙර හඬ නාට්‍යයේ ය.

03. චාල්ස් ඩයස් ශූරීන්ගේ විදුර නාට්‍යයේය.

04. බන්දුල ගුණවර්ධනයන්ගේ බෙර හඬ නාට්‍යයේ ය.

11. මෙම ඡායාරූපයෙන් දැක්වෙන ප්‍රවීණ නර්තන ශිල්පිනිය වන්නේ



01. සෝමලතා සුභසිංහ මහත්මිය ය.

02. වජිරා චිත්‍රසේන මහත්මිය ය.

03. මිරන්ඩා හේමලතා මහත්මිය ය.

04. ලලිතා සරත්චන්ද්‍ර මහත්මිය ය.

12. සකපෝරුව නම් උපකරණය භාවිතයට ගනු ලබන්නේ....................................... සඳහාය.

01. කෘෂි කර්මාන්තය
02. මැටි කර්මාන්තය
03. ධීවර කර්මාන්තය
04. පතල් කර්මාන්තය

13. ^ ,^ , / මෙම තාල සංඥා පිළිවෙලින් හඳුන්වන්නේ

01 තෙයි, තෙයි, තිත් ලෙසය.
02 තිත් ,තෙයි, තෙයි, ලෙසය.
03 තිත්, තිත්, තෙයි ලෙසය.
04 තෙයි, තිත්, තෙයි ලෙසය.

14. සෑම චරිතයක්ම වෙස් මුහුණු පැළඳ රඟ මඩලට පැමිණෙයි, පිරිමි පමණක්ම චරිත නිරූපණයේ යෙදෙයි, මේ ගුණාංග වලින් යුත් ප්‍රධාන ජන නාටකයකි.

01. කෝලම්
02. නාඩගම්
03. නූර්ති
04. සොකරි

15. බුද්ධං සරණේ සිරිස දරාගෙන මෙම ගී පදයේ සඳැස්මත් හා ගීමත් ගණන පිළිවෙලින්

01. මාත්‍රා 14, 21
02. මාත්‍රා 16, 21
03. මාත්‍රා 14, 24
04. මාත්‍රා 16, 24

16. තූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දී එකැස්බෙරය අයත් වනුයේ

01 ආතත වර්ගයට ය
02 විතත වර්ගයට ය
03 විතතාතත වර්ගයට ය
04 ඝන වර්ගයට ය

17. සම්ප්‍රදායත්‍රයෙහිම ප්‍රධාන ශාන්තිකර්ම පැවැත්වීමේ දී ප්‍රථමයෙන්ම කරන පූර්ව චාරිත්‍රය වනුයේ

01. කප් සිටුවීම
02. මඩු පේ කිරීම
03. හඟල පේ කිරීම
04. දෙවියන් වැඩමවීම

18. නර්තන අංගයක් නරඹන විගසම කිනම් සම්ප්‍රදායට අයත් දැයි පහසුවෙන්ම හඳුනාගත හැකි වන්නේ

01. ගායනා , වාද්‍ය භාණ්ඩ හස්ත චලන මගින්
02. හස්ත චලන , රංග වස්ත්‍රාභරණ , වාද්‍ය භාණ්ඩ මගින්
03. හස්ත චලන ,ගායනා, වේෂ නිරූපණය මගින්
04. රංග වස්ත්‍රාභරණ ,ගායනා , වේෂ නිරූපණය මගින්

19. මේරුන් විරාජිත සමන් ………………… යන ගායනය

01. ග්‍රහපන්තියකි
02. සිරස පාදයකි
03. නමස්කාරයකි
04. ශ්ලෝකයකි

**<u>20 සිට 23 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට පහත වගුව භාවිතා කරන්න</u>**

| | නිල් තීරුව | කහ තීරුව | රතු තීරුව | කොළ තීරුව |
|---|---|---|---|---|
| A පේළිය | කොහොඹා දෙවි | වීරමුණ්ඩ දෙවි | දෙවොල් දෙවි | පත්තිනි දෙවි |
| B පේළිය | සේරමන් රජු | විජය රජු | පඩුවස් දෙව් රජු | කුවේණිය |
| C පේළිය | දවුල | හොරණෑව | තම්මැට්ටම | ගැටබෙරය |
| D පේළිය | දඬු බෙරය | තාලම්පට | රබාන | බටනලාව |

20. හේවිසි වාදනයේදී යොදාගන්නා අවනද්ධ භාණ්ඩ දෙක වන්නේ

1. නිල් හා කොළ තීරු C පේළිය
02. නිල් හා රතු තීරු C පේළිය
3. රතු හා කොළ තීරු C පේලිය
04. කහ හා කොළ තීරු C පේළිය

21. උඩරට හා පහතරට ශාන්ති කර්මවල ප්‍රධාන වශයෙන් පුද ලබන දෙවිවරු පිළිවෙලින් සඳහන් වන්නේ.

1. නිල් හා කොළ තීරුවල A පේළියේ ය.
02. නිල් හා කහ තීරුවල B පේළියේ ය.
3. නිල් හා කහ තීරුවල A පේළියේ ය.
04.රතු හා කොළ තීරුවල A පේළියේ ය.

22. විතතාතත භාණ්ඩයක් හා දේශීය සුසිර භාණ්ඩයක් ඇතුළත් වන්නේ

1. නිල් හා කහ තීරුවල C පේළියේ ය.
02. නිල් හා කොළ තීරුවල D පේළියේ ය.
3.නිල් හා රතු තීරුවල D පේළියේ ය.
04. කහ හා රතු තීරුවල D පේළියේ ය.

23. දේශීය ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් දෙකක ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දැක්වෙන්නේ

1.නිල් හා රතු තීරුවල C පේළියේ ය
02. නිල් හා කොළ තීරුවල C පේළියේ ය
3. කහ හා රතු තීරුවල D පේළියේ ය.
04. රතු හා කොළ තීරුවල C පේළියේ ය

24.අංග රචනයේදී මුහුණ බෙදනු ලබන කලාප ගණන වන්නේ

01. 6 කි
02. 7 කි
03. 8කි
03. 9කි

25. මෙම රූපයෙන් දැක්වෙන්නේ



01. මෘදංග වාදන අවස්ථාවකි.
02.චෙන්ගීලම් වාදන අවස්ථාවකි.
03. දවුල් වාදන අවස්ථාවකි.
04.චෙන්ඩා වාදන අවස්ථාවකි.

26. කථකලි නර්තනයේදී පිරිමින් විසින් ස්ත්‍රී චරිත නිරූපනය කිරීම ............................................ලෙස හඳුන්වයි.

01. කුම්මි ආට්ටම්　　　02. ක්‍රිෂ්ණාට්ටම්

02. කුඩි ආට්ටම්　　　03. චක්කියාර් කුතු

ප්‍රශ්න අංක 27 හා 28 සඳහා පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න


A


B


C


D

27. B රූපයෙන් දැක්වෙන නර්තන සම්ප්‍රදාය වනුයේ

01. කතක්　　　02. භරත

03. මනිපුරි　　　04. කථකලි

28. දක්ෂිණ භාරතයේ කේරල ප්‍රාන්තයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය දැක්වෙන්නේ.

01. A රූපයෙන්　　　02. B රූපයෙන්

03. C රූපයෙන්　　　04. D රූපයෙන්

29.







ඉහත ඇඳුම් ආයිත්තම් අයත් නර්තන සම්ප්‍රදායන් පිළිවෙළින්.

01. උඩරට නර්තන සම්ප්‍රදාය,පහතරට නර්තන සම්ප්‍රදාය,සබරගමු නර්තන සම්ප්‍රදාය

02. පහතරට නර්තන සම්ප්‍රදාය, උඩරට නර්තන සම්ප්‍රදාය, සබරගමු නර්තන සම්ප්‍රදාය

03. සබරගමු නර්තන සම්ප්‍රදාය,පහතරට නර්තන සම්ප්‍රදාය, උඩරට නර්තන සම්ප්‍රදාය

04. පහතරට නර්තන සම්ප්‍රදාය, සබරගමු නර්තන සම්ප්‍රදාය, උඩරට නර්තන සම්ප්‍රදාය

30 කරදිය මුද්‍රා නාට්‍යයේ රංග රචනය හා සංගීත නිර්මාණ කරුවන් වන්නේ

01. ලයනල් අල්ගම මහතා හා මහින්ද ඩයස් මහතා ය.


02. චිත්‍රසේන ඩයස් මහතා හා ඩබ්.ඩී. අමරදේව මහතා ය.

03. චිත්‍රසේන ඩයස් මහතා හා ඩබ්.ඩී. මකුලොළුව මහතා ය.

04. සෝමබන්දු විද්‍යාපති මහතා හා ලයනල් අල්ගම මහතා ය.

- **II කොටස උඩරට නර්තන.**

31 මෙම රූපයේ පිළිවෙලින් I, II, III අංක වලින් දැක්වෙන්නේ




01. වෙනිවර කැරැල්ල , වරපට, සුරත්තට්ටුව

02. බෙරපුහුල , වරපට, සුරත්තට්ටුව

03. බෙරපුහුල , වෙනිවර කැරැල්ල, සුරත්තට්ටුව

04. බෙරපුහුල ,ගිගිරි වලල්ල, වෙනිවර කැරැල්ල

32. කොහොඹා කංකාරි ශාන්තිකර්මයට අයත් නාට්‍යමය පෙළපාළි අංග වන්නේ

01. නයා යක්කම,අසුර යක්කම

02. යක්කකම් පහ, ගුරුගේ මාලාව

03. දාන පහ ,ගුරුගේ මාලාව

04. කතා පහ ,නයා යක්කම

33. තත් තකට තකරොං.............................................. තකරොං ගජිං ජිකුඳ .............................කුංදත් ජිකරොං

මෙහි හිස්තැනට ගැලපෙන පද කොටස් ඇතුළත් වරණය තෝරන්න.

01. තක්කඩ තක්කඩ - දොං තරිකිට
02. තක්කඩ කුඳ - ගත්තරිකිට

03. තක්කඩ තක්කඩ කුඳ - කිටිතකට

04. තක්කඩ ජික්කඩ කුඳ - තරිකිට

34. 12/1234 තාල රූපයට අදාල උඩරට බෙර පදය වන්නේ

01. දෝං ජිං ජිං තකට දොම් තක

02. දොං ජිංත ගත දොංත

03. දොංතකු දොං ජිං ගත්තත් ජික්කුඳ

04. දොං දොං ජිං ජිං ගජිගත

35. උඩරට බෙරයේ සම්මත දිග වන්නේ

01. එක් වියත් තුනඟුලකි

02. තුන් වියත් තුනඟුලකි

03. සිවු වියතකි

04. විග්ගුස්සකි

36. කොහොඹා කංකාරියේ පුද ලබන දෙවිවරුන් සඳහන් පිළිතුර තෝරන්න.

01. දැඩිමුණ්ඩ දෙවියන් හා සමන් දෙවියන්

02. දෙවොල් දෙවියන් හා වීරමුණ්ඩ දෙවියන්

03. කන්දේ බණ්ඩාර දෙවියන් හා සමන් දෙවියන්

04. මහ කොහොඹා දෙවියන් හා වීරමුණ්ඩ දෙවියන්

37. කුඳාංත ගත දොම් වට්ටම නටනු ලබන්නේ

01. මාත්‍රා 2+4 තාල රූපයටය

02. මාත්‍රා 2+2+4 තාල රූපයටය

03. මාත්‍රා 2+2+3 තාල රූපයටය

04. මාත්‍රා 3+3තාල රූපයටය

38. උඩරට නර්තනයේ පමණක් භාවිතා කරනු ලබන වචන වන්නේ

01. කුවේන අස්න, දුනුමාලප්පුව,කොහොඹා හැල්ල

02. ආවැන්දුම,කෝල්පාඩුව.කොතල පදය

03. යක් ඇනුම, දුනු මාලප්පුව,මඩු පේකිරීම

04. ආවැන්දුම,ඌරුදානය, කොතල පදය

39.

| | |
|---|---|
| A. උඩරට බෙරය | 1. බලි ගායනය |
| B. ගුරුහාමි | 2. සුරත්තට්ටුව |
| C. අස්නේ | 3. සොකරි |
| D. ආතුරයා | 04. කුවේනි |

ඉහත ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන වචන වලට සුදුසුම අංකය සහිත වචනය ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

01. A - 1 B - 2 C - 3 D - 4

02. A - 2 B - 3 C - 4 D - 1

03. A - 2 B - 4 C - 3 D - 1

04. D - 4 C - 3 B - 2 A - 1


40. "ගසමින් කගපතින් දෙපළුව අසුරසෙන්" මෙහි ඊලඟ කවි පදය වන්නේ

01. දැරුපා අතළුවෙන් - පළුදෙක ගෙන සැනෙකින් 02. එමවන් පළුවකින් - එවුපන් සැනයකින්

03. අසුරන් කළ යුදෙන් - ජය ගෙන කද කුමරුන් 04. සැවුලා නම එයින් -ලොව පළකළ උපතින්

- **IIIකොටස පහතරට නර්තන.**

31. මෙම රූපයේ පිළිවෙලින් I, II, III අංක වලින් දැක්වෙන්නේ




01. වෙනිවර කැරැල්ල, කැපුම් හම,වරපටි

02. බෙර ඇස ,හැක්ම, බෙරලණුව

03. බෙර ඇස, වෙනිවර කැරැල්ල, වරපටි

04. කැපුම් හම,වරපටි, බෙර ඇස

32. දෙවාල්මඩු ශාන්තිකර්මයට අයත් නාට්‍යමය පෙළපාලි අංග වන්නේ

01. ඇත් බන්ධනය, හත්පදය

02. දෙවොල් ගොඩ බැසීම, අඹ විදමන

03. යහන් දැක්ම, දෙවොල්

04. හත්පදය, අඹ විදමන

33. තකදිත් තකදොම් ....................................තරිගත දිගුදාං................................ තකතත් ගුහිති ගදිරිකිට තා.

01. තරගත දිගුදාං - ගුහිති ගදිරිකිට

02. දොම්ත දොම්ත ගත - කිත්තත් කිටිතක

03. කිත්තත් කිටිතක - දොම්ත දොම්ත ගත

04. ගුහිති ගදිරිකිට - තකදිත් තක දොම්

34. 12/1234 තාල රූපයට අදාල පහතරට බෙරපදය වන්නේ

01. ගුං දෙගත ගත්ත ගුම්

02. රෙගුම් ගුඳග් ගත් දෙගත් ගතකු දොම්

03. ගුං දෙගත ගත්ත ගුම්

04. දොම්තම් ගත ගදිතම්ගත ගුගුදංගත ගුදිතං

35. පහතරට බෙරයේ සම්මත දිග වන්නනේ

01. එක් වියත් තුනඟුලකි

02. තුන් වියත් තුනඟුලකි

03. සිවු වියතකි

04. විග්ගුස්සකි

36. දෙවොල්මඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරුන් සඳහන් පිළිතුර තෝරන්න.

01. දැඩිමුණ්ඩ දෙවියන් ,සමන් දෙවියන්

02. පත්තිනි දෙවියන්, කොහොඹා දෙවියන්

03. වීරමුණඩ දෙවියන් ,සමන් දෙවියන්

04. පත්තිනි දෙවියන්, දෙවොල් දෙවියන්

37. ගුඳ ගති ගත වට්ටම නටනු ලබන්නේ

01. මාත්‍රා 2+4 තාල රූපයටය

02. මාත්‍රා 2+2+4 තාල රූපයටය

03. මාත්‍රා 2+2 තාල රූපයටය

04. මාත්‍රා 3+3 තාල රූපයටය

38. පහතරට නර්තනයේ පමණක් භාවිතා කරනු ලබන වචන වන්නේ

01. ඉරට්ටිය,අන්තාඩිය

02. මාත්‍රා පාසරඹ

03. ඉරට්ටිය හා ගොඩ සරඹ

04. සූරල කස්තිරම

39.

| | |
|---|---|
| A. පහතරට බෙරය | 1. බලි ගායනය |
| B. ගුරුහාමි | 2. වෙනිවර කැරල්ල |
| C. පත්තිනි | 3. සොකරි |
| D. ආතුරයා | 04. පාලඟ කුමරු |

ඉහත ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන වචන වලට සුදුසුම අංකය සහිත වචනය ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

01. A - 1 B - 2 C - 3 D - 4

02. A - 2 B - 3 C - 4 D - 1

03. A - 2 B - 4 C - 3 D - 1

04. D - 4 C - 3 B - 2 A - 1

40. සඳ සන්දර දිගු සුන්දර දිගු පුන්දර මෙහි ඊලඟ කවි පදය වන්නේ

01. සැඟවී මෙර යටටා


02. අදභාගා ලෙසටා

03. දිල්මං ඔබ යසටා

04. සෙත දෙන් සවු සතටා

- **IV කොටස සබරගමු නර්තන.**

31 මෙම රූපයේ පිළිවෙලින් I, II, III අංක වලින් දැක්වෙන්නේ




01. වරපටි , ඉල්ලම් මුදු, ගැටිය

02. දවුල් කට්ටුව , වරපටි, ඉල්ලම් මුදු

03. දවුල් කට්ටුව , වරපටි, ඉල්ලම් මුදු

04. ඉල්ලම් මුදු , ගැටිය, දවුල් කට්ටුව

32. පහන් මඩුව ශාන්තිකර්මයට අයත් නාට්‍යමය පෙළපාළි අංග වන්නේ

01. මී බන්ධනය, හත් පදය

02. දෙවොල් ගොඩබැසීම, අඹ විදමන

03. යහන් දැක්ම ,දෙවොල්

04. හත් පදය, අඹ විදමන

33. ජිංත ගතත්........................................... ගදිත .................................තත් තිත් තත්

මෙහි හිස්තැනට ගැලපෙන පද කොටස් ඇතුලත් වරණය තොරන්න.

05. තකට - ගතත්
06. කිත්තත් - කුඳ තා
07. තත්කුඳ ගත - කුඳිත්
08. කුඳිත් - තත් තත් කුඳ ගත

34. 12/1234 තාල රූපයට අදාල සබරගමු දවුල් පදය වන්නේ

01. ජිං කිටිතක් තක් කිටි තක

02. කුඳත කුඳා තක

03. ජිං තක්කට තකට කුඳත්

04. කුඳන් තක්කට තකට ජිංතක

35. උඩරට බෙරයේ සම්මත දිග වන්නනේ

01. අඟල් 26 කි　　02. අඟල් 24 කි

03. අඟල් 27 කි　　04. අඟල් 12 කි

36. පහන් මඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරුන් සඳහන් පිළිතුර තෝරන්න.

01. දැඩිමුණ්ඩ දෙවියන් හා කොහොඹා දෙවියන්

02. පත්තිනි දෙවියන් හා වීරමුණ්ඩ දෙවියන්

03. කොහොඹා දෙවියන් හා පත්තිනි දෙවියන්

04. පත්තිනි දෙවියන් හා සමන් දෙවියන්

37. පට්ටු තාල් මාත්‍රය නටනු ලබන්නේ

01. මාත්‍රා 2+4 තාල රූපයටය

02. මාත්‍රා 2+2+4 තාල රූපයටය

03. මාත්‍රා 3+ 2+2තාල රූපයටය

04. මාත්‍රා 3+3තාල රූපයටය

38. සබරගමු නර්තනයේ පමණක් භාවිතා කරනු ලබන වචන වන්නේ

01. කලාසම, දවුල් පදය　　02. කස්තිරම, මාත්‍රා

03. අඩව්ව, සුරල　　04. සුරල, කලාසම

39.

| | |
|---|---|
| A. දවුල | 1. බලි ගායනය |
| B. ගුරුහාමි | 2. ඉල්ලම් මුදු |
| C. මුගුරුපද | 3. පහන්මඩුව |

D. ආතුරයා 04. සොකරි

ඉහත ඉංග්‍රීසි අක්ෂර වලින් දැක්වෙන වචන වලට සුදුසුම අංකය සහිත වචනය ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

01. A - 1 B - 2 C - 3 D - 4

02. A - 2 B - 4 C - 3 D - 1

03. A - 2 B - 3 C - 1 D - 4

04. D - 4 C - 3 B - 2 A - 1

40. පානා යසසින් සිරිපිරි මෙහි ඊළඟ කවි පදය වන්නේ

01. කුළුණෙන් හිඳ වාරාඩි

02. ලෙස නිරතුරු වීවාඩි

03. මෙවන්නම දනු වීරාඩි

04. යසසින් නෙක වාරාඩි